# 843 ජී පහළ හෙවෙස්ස දකුණ වසමෙහි තොරතුරු

- කළුතර දිස්ත්‍රික්කයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතුරින් ඌන ග්‍රාම නිලධාරී වසම් 60 න් එක් වසමකි. හෙක්ටයාර් 210.6 ක් පමණ භූමි ප්‍රමාණයකින් යුක්තය. රක්ෂිත වනාන්තරවලින් හා තෙත් වියළි බිම්වලින් නිර්මාණය වී ඇත. වර්ෂය පුරා පැතිරුණු අධික වර්ෂාපතනයක් මෙම කලාපයට ලැබේ.

- **වසමෙහි පිහිටීම:-**

උතුරින් :- 843 ඒ පහළ හෙවෙස්ස වසම ද
දකුණින් :- පැලවත්ත නැගෙනහිර හා මිරිස්වත්ත වසම ද
බටහිරින් :- 843 අයි රණේපුරගොඩ වසම ද
නැගෙනහිරින් :- 843 ඊ තුංදොළ වසම ද පිහිටීම මායිම් ලෙස දැක්විය හැකිය.

- **වසමෙහි නම සැදුණු ආකාරය:-**

16 වන සියවසේ මුල් භාගයේදී පස්යොදුන් රට තාවකාලික රාජධානියක් කරගනිමින් රණශූර වීදිය බණ්ඩාර තම හේවායින් ආරක්ෂිත ස්ථානවල මුරකාවල් යොදා තිබූ අතර දකුණු සීමාවේ පහල හේවායින් විස්ස බැගින් මුරකාවල් යොදා තිබුණු බැවින් පසු කාලීනව පහල හෙවෙස්ස දකුණ ලෙස නම් කරනු ලැබූ බවත් පැරණි ගැමියන් අතර ව්‍යවහාරයේ පවතී.

- **වසමට යන ගමන් මාර්ගය:-**

කළුතර නගරයේ සිට ගමන් මාර්ග විස්තර කලහොත් කලුතර ගාලු පාරේ කටුකුරුන්ද හන්දියෙන් වමට හැරී මතුගමට පැමිණ, මතුගම අලුත්ගම මාර්ගයේ හොරවල හන්දියෙන් වමට හැරී මීගහතැන්න හරහා පැලවත්තට පැමිණිය හැකිය. පැලවත්තෙන් හෙවෙස්ස බදුරලිය පාරේ කි.මී. 1 1/2 ගිය පසු පහල හෙවෙස්ස දකුණ වසමට පිවිසිය හැකිය.

- වසමට අයත් ගම් පිළිබඳ තොරතුරු:-

පහල හෙවෙස්ස කොටසක් අයත් වේ.